<u>කාර්ය පත්‍රිකා 3</u>

නිපුණතාවය - 1.0 **පාඩම - සරල තාල පද අධ්‍යනය**

නිපුණතා මට්ටම - 1.4

I කොටස

පහත සඳහන් ප්‍රශ්නවලට දී ඇති වරණ අතුරින් නිවැරදි වරණයට හිමි අංකය දී ඇති හිස්තැන මත ලියන්න.

1. ඒක්තාලය භාවිතා කරන සංගීතාංග අඩංගු පිළිතුර වන්නේ (------)
   I. ඛ්‍යාල්, තරාණා ගායන හා ඒකල තබ්ලා වාදනය සඳහාය
   II. ඛ්‍යාල්, තරාණා හා ධ්‍රැපද් ගායනා සඳහාය
   III. ධමාර්, ඛ්‍යාල් ධ්‍රමරි ගායනා සඳහාය
   IV. ඛ්‍යාල්, තරාණා හා ටප්පා ගායනා සඳහා ය

2. බඩාඛ්‍යාල් සඳහා පමණක් භාවිත කරන තාලය වන්නේ, (------)
   I. ඒක්තාල් ii. තිලවඩා iii. හීන්ච් iv. පංජාබ්
3. හින්දුස්ථානි තාල නිරූපණයේ දී ආසාතය තැබීම හඳුන්වන පද වන්නේ (------)
   i. බාලී ii. ඛ්‍යාලී iii . තාලී iv. තබාලි
4. ඒක්තාලයට හිමි මාත්‍රා ගන්න (------)
   i. 14 කි ii. 16 කි iii . 12 කි iv. 10 කි
5. දාදරා තාලය මෙන් ප්‍රස්ථාර කළ ද දාදරා තාලයේ ලයට වඩා වේගවත් තාලය (------)
   i. ඒක්තාල් ii. ත්‍රිතාල් iii . හීන්ච් iv. වෙච්ටො

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න

6. මත් ගණනින් සමාන නිර්දේශිත තාල 3 ක් නම් කරන්න.
7. ඨුම්රි ටප්පා ගායන ශෛලීන් සඳහා භාවිත වන නිර්දේශිත තාලය කුමක් ද?
8. ධ්‍රැපද් ගායනා සඳහා උපයෝගී කරගන්න තාලය නම් කරන්න.
9. විලම්භ, අතිවිලම්භ, මධ්‍ය, ද්‍රුත යන ලයවල භාවිත වන නිර්දේශිත තාලය කුමක් ද?
10. පංජාබ් තාලය වාදනය සඳහා භාවිත කරන තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද?

II කොටස

1. ඒක්තාල් හා තිලවඩා යන තාල පද තාල සංඥා සහිතව සමගුණ හා දෙගුණ ප්‍රස්ථාර ගත කරන්න.
2. චෞතාල් හා ඒක්තාල් තාල සංසන්දනය කර දක්වන්න.
3. මාත්‍රා 16 ක් සහිත නිර්දේශිත තාල නම් කර ප්‍රස්ථාර කරන්න.
4. චෞතාල් හා ඒක්තාල් තාල පද සංසන්දනය කර දක්වන්න